### 1) කඩොලාන සංරක්ෂණය හා තිරසාර භාවිතය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සැකසීමේ වැඩමුළුව

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය මගින් කඩොලාන සංරක්ෂණය හා තිරසාර භාවිතය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සැකසීම සඳහා විෂය පිළිබඳ විද්වතුන් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සහ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් වැඩමුළු රාශියක් පවත්වන ලදී. ඒ පිළිබඳ අවසන් වාර්තාව පිළියෙළ කිරීම සඳහා අදහස් ලබා ගැනීම අරමුණු කරමින් 2016 අගෝස්තු 12 වෙනි දින රාජගිරිය බැංකු පියසේදී වැඩමුළුවක් පවත්වන ලදී.




### 2) ජෛව විවිධත්වය පිළිබඳ ජාතික විද්වත් කමිටු රැස්වීම

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය මගින් ජෛව විවිධත්ව සංරක්ෂණය හා තිරසාර සංවර්ධනය උදෙසා තිරසාර භාවිතාව පිළිබඳ තීරණ ගැනීම සඳහා ජෛව විවිධත්වය පිළිබඳ ජාතික විද්වත් කමිටුවක් පත්කර ඇත. එම කමිටුවේ රැස්වීමක් 2016 සැප්තැම්බර් 13 වන දින සෙත්සිරිපාය රැස්වීම් ශාලාවේදී විශ්ව විද්‍යාල ආචාර්ය ,මහාචාර්යවරුන් ඇතුළු රාජ්‍ය හා රාජ්‍ය නොවන නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පැවැත්වූ අතර ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරී සැලැස්මේ විෂය ක්ෂේත්‍ර පිළිබඳ කරුණු රැසක් සාකච්ඡා කිරීම හා තීරණ ගැනීම සිදුවිය.

**3) පරාගවාහකයන් සංරක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු මාලාව**

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය හා යාපනය විශ්ව විද්‍යාලයේ සත්ත්ව විද්‍යා අංශයේ සහයෝගිතාවයෙන් පරාගවාහකයන් සංරක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ පහත සඳහන් වැඩමුළු මාලාව පවත්වන ලදී.

1) 2016 අගෝස්තු 19 දින මරවන්පුලෝ සකලකලවාලී විද්‍යාලය
2) 2016 සැප්තැම්බර් 09 දින චාවාකච්චේරි කාන්තා විද්‍යාලය
3) 2016 සැප්තැම්බර් 19 දින යාපනය තිරුවෙල්වේලි දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය

මෙම වැඩමුළු සංවිධානය කිරීම මගින් ගම්බදව ව්‍යාප්තව ඇති දේශීය පරාගවාහකියින් පිළිබඳව වැදගත්කම හඳුනාගැනීම, ජීවන විලාශය අවබෝධ කිරීම ඇතුළු පැවැත්ම වර්ධනය කිරිම,සංරක්ෂණය කිරීම මේ වැඩමුළු තුළින් අපේක්ෂා කරන ලදී.







